## ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය - 2012

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දැක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

නියෝජිතායතනයේ බොල් හා අඩමාණ ණය වෙන්කිරීමේ ප්‍රතිපත්තිය හෙළිදරව් කර නොතිබුණි.

#### 1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ඉදිරියට ගෙන ආ ලැබිය යුතු ස්ථාවර තැන්පතු ආරම්භක පොලී ශේෂය හා ස්ථාවර තැන්පතු ආයෝජන වෙනුවෙන් ලැබිය යුතු පොලී ආදායම පිළිවෙලින් රු.142,600 ක් හා රු.290,612 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) ස්ථාවර තැන්පතු ආයෝජන වටිනාකම රු.279,443 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

---

(ඇ) මීගමුව කඩොල්කැලේ ප්‍රාදේශීය පර්යේෂණ මධ්‍යස්ථානයේ අත්හැර දමා ඇති, නියෝජිතායතනය විසින් නිෂ්ක්‍රීය වත්කමක් ලෙස හඳුනාගත් මායිම් තාප්පය හා උද්‍යානය සඳහා දරා ඇති වියදම වූ රු.470,234 ක් කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබුණි.

(ඈ) විදේශ ප්‍රදාන වශයෙන් ලැබූ පරිගණක හා උපකරණ වාර්ෂිකව විලම්භනය කිරීමේදී පිළිවෙලින් විලම්භිත ආදායම රු.251,296 වැඩියෙන් හා රු.759,169 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඉ) බේරුවල නගරයේ ඉදිකෙරෙමින් පවතින මසුන් වෙළඳසැල වෙනුවෙන් වැය කර ඇති රු.4,272,492 ක වටිනාකම කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම්ගත කිරීම වෙනුවට අත්තිකාරම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ පර්යේෂණ යාත්‍රාව රක්ෂණය කිරීම වෙනුවෙන් ගෙවන ලද රු.4,730,403 ක් වූ රක්ෂණ වාරිකය ප්‍රාග්ධන වියදමක් සේ සලකා ප්‍රාග්ධනිත කර තිබුණි.

### 1.2.3 නොසැසඳූ පාලන ගිණුම්

මූල්‍ය ප්‍රකාශනයන් හා උපලේඛනයන් අතර පහත සඳහන් නොසැසඳීම් නිරීක්ෂණය විය.

| විස්තරය | මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය | උපලේඛනය අනුව ශේෂය | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| විදේශ ප්‍රදාන | 220,528,683 | 54,576,186 | 165,952,497 |
| දේශීය ප්‍රදාන | 24,538,781 | 6,967,343 | 17,571,438 |

### 1.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයේදී ණයගැති ශේෂවල වටිනාකම රු.34,652,667 ක් වූ අතර, කාල විශ්ලේෂණය අනුව ඉන් රු.4,816,690 ක ශේෂ වර්ෂ 02 කට වඩා පැරණි ශේෂයන් විය. මෙම ශේෂයන් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයේ දී ණයහිමි ශේෂවල වටිනාකම රු.28,841,961 ක් වූ අතර, කාල විශ්ලේෂණය අනුව ඉන් රු.1,887,342 ක ශේෂ වර්ෂ 04 කට වඩා පැරණි

ශේෂයන් විය. මෙම ශේෂ නිරවුල් කිරීමට කටයුතු නොකර දිගින් දිගටම ඉදිරියට ගෙන එමින් තිබුණි.

### 1.2.5 නීති, රීති රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීම් පහත දැක්වේ.

| නීති, රීති යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි අංක 751 | සමාලෝචිත වර්ෂයේ මිලදී ගන්නා ලද වටිනාකම රු.307,824,862 ක් වූ පර්යේෂණ යාත්‍රාව හා ඊට අදාල අනෙකුත් උපකරණ තොග පොත්වල සටහන් කර නොතිබුණි. |
| (ආ) භාණ්ඩාගාර චක්‍රලේඛ | |
| (i) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන චක්‍රලේඛය | වටිනාකම රු.1,376,638,289 ක්වූ ස්ථාවර වත්කම් වෙනුවෙන් විධිමත් පරිදි ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| (ii) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඑෆ්අයි/2002/02 දරන චක්‍රලේඛය | වටිනාකම රු.51,595,553 ක් වූ පරිගණක හා පරිගණක උපාංග සම්බන්ධයෙන් ලේඛනයක් යාවත්කාලීනව පවත්වා නොතිබුණි. |
| (ඇ) 2007 අප්‍රේල් 06 දිනැති අංක 33 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | නියෝජිතායතනය විසින් කරන ලද සේවා සැපයීමක් ව්‍යාපෘතියක් ලෙස සලකා ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් පිහිටුවා ව්‍යාපෘති අධ්‍යක්ෂ, ව්‍යාපෘති අධීක්ෂණ නිලධාරී හා මූල්‍ය පාලක විසින් එකතුව රු.761,047 ක් දීමනා ලෙස ලබාගෙන තිබුණි. |
| (ඈ) 2003 ජුනි 02 දිනැති අංක 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.4 වගන්තිය | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව නිලධාරීන් වෙනත් ආයතන හෝ රේඛීය අමාත්‍යාංශ වෙත නිදහස් කල නොහැකි බව දන්වා තිබියදීත් නියෝජිතායතනයේ සේවයේ නියුතු නිලධාරීන් තුන් දෙනෙකු ධීවර හා ජලජ සම්පත් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය කාර්යාලය වෙත නිදහස් කර තිබූ අතර |

සමාලෝචිත වර්ෂයේදී වැටුප් ලෙස රු.1,323,200 ක් ගෙවා තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නියෝජිතායතනයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.93,909,306 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.41,313,223 ක් වූයෙන්, මූල්‍ය ප්‍රතිඵලයෙහි තවදුරටත් රු.52,596,083 ක පිරිහීමක් පෙන්නුම් කෙරිණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව නඩත්තු වියදම් හා වෙනත් මෙහෙයුම් වියදම් පිළිවෙලින් සියයට 87 කින් හා සියයට 148 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

### 2.2 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

ආයතනයක තිබිය යුතු ජංගම වත්කම් හා ජංගම වගකීම් අනුපාතය 2:1 විය යුතු වුවත් නියෝජිතායතනයේ ජංගම වත්කම් හා ජංගම වගකීම් අතර අනුපාතය 0:0.74 ක්වී තිබුණි. ඒ අනුව නියෝජිතායතනය දැඩි කාරක ප්‍රාග්ධන අර්බුදයකට මුහුණදී ඇති බව නිරීක්ෂණය වේ.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 3 ක නියෝජිතායතනයේ පර්යේෂණ හා සංවර්ධන වියදම් වෙනුවෙන් ලද ප්‍රදාන හා ඉන් දරා ඇති වියදම පහත පරිදි විය.

| | වර්ෂය | | | |
|---|---|---|---|---|
| | 2012 | 2011 | 2010 | 2009 |
| ලැබූ මුළු ප්‍රදාන (රු.මිලියන) | 274 | 311 | 218 | 246 |
| පර්යේෂණ හා සංවර්ධන වියදම්(රු.මිලියන) | 54 | 46 | 37 | 36 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2011 ට සාපේක්ෂව 2012 දී ලැබූ මුළු ප්‍රදාන රු. මිලියන 37 කින් අඩුවී තිබුණි.

(ii) 2011 ට සාපේක්ෂව 2012 දී පර්යේෂණ හා සංවර්ධන වියදම් වෙනුවෙන් දරා ඇති මුළු වියදමේ වර්ධනය රු.මිලියන 8 ක් වී තිබුණි.

(iii) මුළු ප්‍රදාන වලින් පර්යේෂණ හා සංවර්ධන වියදම් සඳහා දරා ඇති වියදම සියයට 20 ක් වී තිබුණි.

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) වෙරළාසන්න කලාපයේ පර්යේෂණ කටයුතු සඳහා යොදවා ගත හැකි වන පරිදි රු.13,192,703 ක වියදමකින් නිෂ්පාදනය කර ඇති යාත්‍රාව මෙතෙක් පර්යේෂණ කටයුතු සඳහා ප්‍රමාණවත් ලෙස භාවිතා කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂයේදී වැටුප්,ආරක්ෂක කටයුතු හා අතිකාල දීමනා ලෙස රු.1,106,569 ක් යාත්‍රාවේ සේවයේ නියුතු නිලධාරීන් වෙනුවෙන් දරා තිබුණි.

(ආ) ජල බිල්පත් නියමිත කාලසීමාව තුල ගෙවීම තුලින් ලබාගත හැකිව තිබූ රු.124,336 ක් වූ වට්ටම් වාසිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 3.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) තන්දූරි උඳුනක් මිලදී ගැනීම වෙනුවෙන් රු.120,000 ක් ගෙවා තිබූ අතර මෙම උඳුන වසර දෙකකට වැඩි කාලයක් නිෂ්කාර්යව තබා තිබුණි.

(ආ) මෘදුකාංගයක් මිලදී ගැනීම සඳහා රු.272,160 ක් වැයකර තිබූ අතර එම මෘදුකාංගය වසර 04 කටත් වඩා වැඩි කාලයක් නිෂ්කාර්යව තබා තිබුණි.

(ඇ) යෝජිත භෝජන ශාලාවක් ඉදිකිරීම සඳහා රු.855,938 ක් වැයකර තිබූ නමුත් මෙම ඉදිකිරීම වසර දෙකකට වැඩි කාලයක සිට අත්හැර දමා තිබුණි.

(ඈ) වටිනාකම රු.4,493,052 ක් වූ බෝට්ටු ඇන්ජින් දෙකක් වසර දෙකකට වැඩි කාලයක සිට ප්‍රයෝජනයට ගැනීමකින් තොරව නිෂ්කාර්යව තබා තිබුණි.

## 3.4 කාර්ය මණ්ඩල පරිපාලනය

2012 දෙසැම්බර් 31 දිනට නියෝජිතායතනයේ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|
| මාණ්ඩලික | 165 | 79 | 86 |
| මාණ්ඩලික නොවන | 258 | 211 | 47 |
| එකතුව | 423 | 290 | 133 |

අනුමත සේවක සංඛ්‍යාව හා සැසඳීමේදී පුරප්පාඩු සේවක සංඛ්‍යාව සියයට 31 ද ඉක්මවා තිබුණි. "බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටි අනුමත නොකිරීම මත ප්‍රතිපාදන වෙන් නොවීම හේතුවෙන් බඳවාගැනීම් සිදු කිරීමට නොහැකිවී ඇත." යන්න සභාපතිවරයාගේ පිළිතුර විය.

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණනයේ රාජකාරී හා වගකීම් කරගෙන යාම සම්බන්ධයෙන් ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් පත්කර නොතිබූ අතර,ප්‍රධාන කාර්යාලයේ අභ්‍යන්තර විගණන අංශයේ කටයුතු කරගෙන යාම සඳහා සහායක නිලධාරි තනතුරු ඇතුළත් වන ආකාරයට කාර්ය මණ්ඩල බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කර නොතිබුණි.

### 4.2 ප්‍රසම්පාදන සැලැස්ම

**සමාලෝචිත වර්ෂය සඳහා** ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණයවූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර නියෝජිතායතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුව ඇත.

(අ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(ආ) මානව සම්පත්

(ඇ) ආයෝජන

(ඈ) ස්ථාවර වත්කම්

(ඉ) පරිගණක හා උපාංග

(ඊ) මිලදීගැනීම්

(උ) තොග